අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/08/26/27/02/ ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2020.07. 27

චක්‍රලේඛ අංකය - 18/2020

සියලු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන පරිපාලන),
සියලුම විෂය අධ්‍යක්ෂවරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,
සියලුම කොට්ඨාශ අධ්‍යාපන නිලධාරීන්,
සියලුම විදුහල්පතිවරුන්,

**<u>සාමාන්‍ය අධ්‍යාපනය සඳහා ජාතික ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධතිය ලෙස e-තක්සලාව, ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධතිය ප්‍රකාශයට පත්කිරීම සහ භාවිතය ප්‍රචලිත කිරීම.</u>**

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාසල් පද්ධතිය සඳහා 2013 වර්ෂයේ දී හඳුන්වාදෙන ලද e -තක්සලාව ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධතිය, මේ වනතෙක් ප්‍රශස්ත සේවාවක් සිදුකරනු ලබන බැවින් සහ එහි අවශ්‍යතාවය මැනවින් තහවුරු වී ඇති බැවින්, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය සඳහා වන ජාතික නිල ඉගෙනුම් අන්තර්ගත පද්ධතිය ලෙස "e -තක්සලාව", මෙ මගින් ප්‍රකාශයට පත් පත්කරනු ලැබේ.

**මෙම පද්ධතියට https://e-thaksalawa.moe.gov.lk මගින් ප්‍රවේශ විය හැක.**

**02.** e -තක්සලාව, 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් පවත්වනු ලබන ජාතික මෘදුකාංග ඇගයීම සඳහා වන "e-ස්වාභිමානී" තරඟයෙන් ජයග්‍රාහකයා ලෙස ද, දකුණු ආසියා රටවල් කේන්ද්‍ර කරමින් ඉන්දියාවේ පවත්වනු ලැබූ "මාන්තන්" තරඟයෙන් ද ලද ජයග්‍රහණය e -තක්සලාව, ශ්‍රී ලංකාවේ සමස්ත සාමාන්‍ය අධ්‍යාපනය පද්ධතිය වෙත කොතරම් දුරට ගැළපෙන්නේ ද යන්න සඳහා ජාත්‍යන්තර මට්ටමෙන්ද ලබාදෙන ලද සහතිකයක් වේ.

**03.** COVID-19 වසංගත තත්වය හමුවේ බොහෝ රටවල්වල රාජ්‍ය මැදිහත්වීම මත සකස් කළ e -ඉගෙනුම් ක්‍රමවේදයන් පිළිබඳව UNESCO ආයතනය විසින් සිදුකරන ලද අධ්‍යනයකට අනුව ජාතික මට්ටමේ ඉගෙනුම් පද්ධති යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නිල ඉගෙනුම් පද්ධතිය ලෙස e-තක්සලාව නිර්දේශකර ප්‍රකාශයට පත්කර ඇත.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

## 5.4 e -තක්සලාව හැර වෙනත් එවන් ඉගෙනුම් අන්තර්ගත පද්ධති ක්‍රියාත්මක නොකිරීම.

විවිධ පෞද්ගලික ආයතන, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන හා ආයතන විසින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල, පළාත් හා ජාතික පාසල්, පරිගණක සම්පත් මධ්‍යස්ථාන, ගුරු මධ්‍යස්ථාන සහ විද්‍යාපීඨයන් හඳුන්වාදීමට යෝජනා කරනු ලබන විවිධ ඉගෙනුම් කළමනාකරණ පද්ධති සඳහා ඔබගේ එකඟතාවය ලබා දීම කිසිසේත් සිදු නොවිය යුතුය.

එම ආයතන / සංවිධාන විසින් ලබා දෙන යම්කිසි විෂයානුබද්ධ විෂය අන්තර්ගතයක් වේ නම් නිසි ඇගයීම් ක්‍රමවේදයක් මගින් ගුණාත්මක බව තහවුරුකර අදාළ නිර්දේශ සමඟ e -තක්සලාව ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධතිය තුළ ඇතුළත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශය වෙත යොමුකිරීම  අවශ්‍ය වේ.

විශේෂයෙන්ම, ඉගෙනුම් කළමනාකරණ පද්ධතිවල තිබිය යුතු ගුණාංගවලින් ඉතා අල්ප කොටසක් සහිතව හුදකලා පද්ධති නිර්මාණය කිරීම, නඩත්තු කිරීම, ආරක්ෂණ පියවර පවත්වාගැනීම සහ තොරතුරු ගබඩා කිරීම වැනි දෑ සඳහා අනවශ්‍ය පරිදි ගත කරන කාලය, පිරිවැය මෙන්ම ඒ සඳහා යොදවනු ලබන මානව සම්පත ද අපතේ යාමක් බව හඳුනාගෙන ඇත.

එමෙන්ම එසේ ආරම්භ කරනු ලබන බොහොමයක් පද්ධති කෙටි කලක් තුළදී අකර්මන්‍ය වීම මගින් අධ්‍යාපන පද්ධතිය ද අහිතකර ලෙස විවේචනයට ලක්වීම සිදුවන බව අවධානයට යොමු වී ඇති අතර ජාතික වශයෙන් සියලුම සිසුන්ට ද භාවිත කළහැකි පොදු පද්ධතියක් තුළ සියලුම අන්තර්ගතයන් අඩංගු කිරීම මඟින් විශාල වපසරියක ඉගෙනුම් කරුණු සියලුම සිසුන්ට දීර්ඝ කාලයක් පරිශීලනය කිරීමේ අවස්ථාව ද e -තක්සලාව මඟින් හිමිවන බැවින් මේ අනුව කටයුතු කිරීම අවශ්‍ය වේ.

මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව කටයුතු කිරීම සඳහා ඔබගේ  කාර්ය මණ්ඩලය, විදුහල්පතිවරුන් ඇතුළු සියලුම නිලධාරීන් දැනුවත් කිරීම අත්‍යවශ්‍ය බව වැඩිදුරටත් අවධාරණය කරමි.

එන්. එච්. එම්. චිත්‍රානන්ද,

ලේකම්,

අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත් :-

1. විගණකාධිපති,
2. පළාත් ප්‍රධාන ලේකම්වරු,
3. සියලුම අතිරේක ලේකම්වරු, අධ්‍යාපන අමාත්‍යාංශය.
4. පළාත් අධ්‍යාපන ලේකම්වරු,
5. විභාග  කොමසාරිස් ජනරාල්,
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
7. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය,
8. ලේකම් ජනරාල්, ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව,
9. සභාපති, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය (ICTA),
10. අධ්‍යක්ෂ ජනරාල් (ගිණුම් හා මූල්‍ය), අධ්‍යාපන අමාත්‍යාංශය.
11. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධ්‍යාපන අමාත්‍යාංශය.
12. සියලුම ප්‍රධාන ගණකාධිකාරීවරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය.